ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

වැසි ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

"සෙත්සිරිපාය"

බත්තරමුල්ල

පටුන

01. **හැඳින්වීම** .... Error! Bookmark not defined.

02. ප්‍රතිපත්තියේ පදනම සහ ලක්ෂණ **2**

2.1 ප්‍රතිපත්තිය සඳහා පදනම් වූ මූලධර්ම **2**

2.2 ප්‍රතිපත්ති ප්‍රකාශය **3**

2.3 ප්‍රතිපත්තියේ අරමුණු **4**

2.4 ප්‍රතිපත්ති ඉලක්ක **4**

03. ප්‍රතිපත්තියේ විෂය පථය සහ අදාළත්වය **5**

04. ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග **6**

05. පාර්ශවකරුවන් **7**

06. ව්‍යවස්ථාදායක සහාය **7**

01. හැඳින්වීම

"අහසින් වැටෙන එකදු දිය බිඳක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදෙන්න" යනුවෙන් ප්‍රකශ කළ මහා පරාක්‍රමබාහු රජතුමාගේ සදාකාලික ප්‍රඥාවෙන් අභාෂය ලැබූ ශ්‍රී ලංකාව, වැසි ජලය අත්‍යාවශ්‍ය ජාතික සම්පතක් ලෙස අතීතයේ සිටම හඳුනාගෙන ඇත. දේශගුණික විපර්යාසයන්ගේ වැඩිවීම, ජල හිඟය සහ ජල සම්පත් සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම හමුවේ, වැසි ජලය රැස්කිරීම (RWH) ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ජල සුරක්ෂිතතාව, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර සංවර්ධනය ඉහළ නැංවීම සඳහා වූ වැදගත් ජාතික ප්‍රමුඛතාවක් බවට පත්ව ඇත.

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම සහ මධ්‍යම කඳුකරයේ පිහිටීම හේතුවෙන්, මැයි සිට සැප්තැම්බර් දක්වා ක්‍රියාත්මක වන නිරිතදිග මෝසම සහ දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ක්‍රියාත්මක වන ඊසානදිග මෝසම යන මෝසම් දෙකකින් මෙන්ම, ඒ අතරතුර උදාවන අන්තර් මෝසම් දෙකකින් ද ආශිර්වාද ලබා ඇත. දිවයින පුරා වර්ෂාපතනයේ ප්‍රමාණය, තීව්‍රතාවය සහ ඍතුමය ව්‍යාප්තිය සැලකිය යුතු ලෙස වෙනස් වුවද, ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශවලට සෑම වසරකම වර්ෂාපතනය ලැබෙන බැවින් වැසි ජලය සියලු දේශගුණික කලාප පුරා අඛණ්ඩව ලබාගත හැකි ස්වභාවික සම්පතක් බවට පත්ව ඇත. කෙසේ වෙතත්, ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද නිරීක්ෂණය කර පුරෝකථනය කර ඇති ස්වභාවික සංසිද්ධීන්ගේ අනාගත ආන්තික දේශගුණික වෙනස්වීම්වල බලපෑම හේතුවෙන්, මේ සම්බන්ධයෙන් අපට තෘප්තිමත් විය නොහැක.

ඍතුමය සහ කලාපීය විෂමතා, පහත් බිම් අක්‍රමවත් ලෙස ගොඩකිරීම සහ ස්වභාවික ජලාපවහන මාර්ග අවහිර කිරීම වැනි අවධිමත් භූමි කළමනාකරණ පිළිවෙත්, මෙම සම්පත ගබඩා කර තබා ගැනීමේ සහ ක්‍රමයෙන් මුදා හැරීමේ යාන්ත්‍රණ ප්‍රමාණවත් නොවීම මෙන්ම මිනිසා සිතාමතා සිදුකරන ඇතැම් ක්‍රියා සහ නොසැලකිලිමත් මඟ හැරීම් හේතුවෙන්, සැලකිය යුතු ජල ප්‍රමාණයක් මතුපිට ජලය බවට පත්වී වේගයෙන් මුහුදට ගලා යාමද, ඒ අතරතුර වාෂ්පීකරණයට ලක්වීමද සිදුවන අතර, එම ක්‍රියාවලිය තුළ ජල ආර්තිය (water stress) ඇතිවීමට මඟ පාදයි.

රටේ සමහර ප්‍රදේශවල වර්ෂාපතනයේ හිඟකම නිසා නියඟය ඇති වන අතර, ඒ හා සමගාමීව තවත් ප්‍රදේශවල අධික වර්ෂාපතනය හේතුවෙන් ගංවතුර ඇති වේ; මේ නිසා ගලායන වැසි ජලය (storm water) විශාල ප්‍රමාණයක් කළමනාකරණය කිරීමට සිදුවන අතර, එය අසාර්ථක වුවහොත් පහත් බිම් ජලයෙන් යටවීම සහ ප්‍රයෝජනයට නොගත් මතුපිට ගලායන ජලය (runoff) විශාල ප්‍රමාණයක් ඉන්දියන් සාගරයට එකතු වීමෙන් අපතේ යාම සිදුවේ.

ග්‍රාමීය මෙන්ම නාගරික පුරවැසියන්, සියලු සත්ත්ව හා ශාක ප්‍රජාව මෙන්ම අනෙකුත් ජීවී විශේෂයන්ගේ ද සමාජයීය අවශ්‍යතා සපුරාලීම සහ වසර පුරා සාධාරණ ලෙස ජලය ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ජලය සැපයීමේ සහ අතිරික්ත ජලය බැහැර කිරීමේ අභියෝගය ශ්‍රී ලංකාවේ තීරණ ගන්නන් මුහුණ දෙන වඩාත්ම තීරණාත්මක ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත.

වැසි ජලය ගබඩා කර තබා ගැනීම සඳහා පස සතු ස්වභාවික රඳවා ගැනීමේ ධාරිතාවය අඩු කරන සංවර්ධන කටයුතු හේතුවෙන් ඇතිවන අහිතකර සමාජීය හා පාරිසරික බලපෑම් පිළිබඳව ශ්‍රී ලංකා රජය හඳුනාගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස වරින් වර ඇතිවන නියඟ සහ ගංවතුර හේතුවෙන් ජනතාව පීඩාවට පත්වන අතර, විශාල ආර්ථික පාඩු මෙන්ම පසුව සිදුකරන සහන සේවා සඳහා ද විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. මේ දක්වා අවධානය බෙහෙවින්ම යොමු කර ඇත්තේ සාම්ප්‍රදායික, මධ්‍යගත ප්‍රවේශයන් කෙරෙහි පමණක් වන අතර විකල්ප ක්‍රමවේදයන් කෙරෙහි දක්වා ඇත්තේ සීමිත අවධානයකි. එබැවින්, දිවයින පුරා වසරකට මිලිමීටර් 750 සිට 6000 දක්වා පරාසයක පවතින වර්ෂාපතනයේ ඉහළ කාලීන හා ඍතුමය විචල්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ජල හිඟය සහ අතිරික්තය අතර පරතරය පියවීම සඳහා

රැස්කරගත් වැසි ජලය ඒකාබද්ධ අනුවර්තන පියවරක් (integrated adaptive measure) ලෙස භාවිතා කිරීමේ වැදගත්කම රජය විසින් පිළිගෙන ඇත.

වැසි ජලය එකතු කිරීම මඟින් අනෙකුත් සීමිත ජල මූලාශ්‍ර භාවිතය අවම කිරීමට දායකත්වයක් සැපයෙයි. වැසි ජලය රැස්කිරීම (RWH) යනු ඒකාබද්ධ ජල කළමනාකරණයේ මූලික අංගයක් වන අතර, එමඟින් පොදු ජල උපයෝගිතා සහ යටිතල පහසුකම් මත ඇති වන පීඩනය අඩු කරන අතරම, දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම්වලට මුහුණ දීමේ හැකියාව නගර තුළ තවදුරටත් ශක්තිමත් කරයි. අපගේ ප්‍රජාවන් වෙත තිරසාර බලශක්තිය, ජලය සහ අනෙකුත් හරිත යටිතල පහසුකම් ළඟා කර දීම අරමුණු කරගත් තිරසාර සැලසුම්කරණ උපායමාර්ගවල අංගයක් ලෙස වැසි ජලය රැස්කිරීම (RWH) ඇතුළත් කර ගැනීමට ගෘහ නිර්මාණ ශිල්පීන්ට, සැලසුම්කරුවන්ට සහ නිර්මාණකරුවන්ට සමාජීය මෙන්ම පාරිසරික වගකීමක් ඇත.

ගංවතුර අවදානම අවම කිරීමෙහිලා මෙන්ම "හරිත" සහ "තිරසාර" නිවාස සඳහා දිනෙන් දින ඉහළ යන පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට ද වැසි ජලය රැස්කිරීම (RWH) සතු කාර්යභාරය පිළිගෙන ඇත. භූගත ජලය ප්‍රත්‍යාරෝපණය (groundwater recharging) සඳහා වැසි ජලය භාවිතා කිරීම දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට සහ ජල විද්‍යාත්මක අවදානම (hydrological vulnerability) අඩු කිරීමට ඇති වැදගත් අනුවර්තන අවස්ථාවකි.

ජලයේ ප්‍රමාණය මෙන්ම ගුණාත්මකභාවය යන අංශ දෙකම සැලකිල්ලට ගනිමින්, වැසි ජලය රැස්කර තබා ගැනීමේ ස්පෘශ්‍ය ප්‍රතිලාභ මෙන්ම ක්ෂුද්‍ර හා සාර්ව ජල පෝෂක පද්ධති (micro- and macro-watershed systems) තුළ ජල සංරක්ෂණය සඳහා වැසි ජලය රැස්කිරීමේ (RWH) ඇති වැදගත්කම පිළිබඳව පොදු මහජනතාව, ආයතන, කර්මාන්ත, සෞඛ්‍ය පහසුකම් මධ්‍යස්ථාන සහ පාසල් ආදිය දැනුවත් කළ යුතුව ඇත.

පවතින ජල සැපයුම් වර්ධනය කිරීම, නැවත භාවිතය හා ප්‍රත්‍යාරෝපණය මෙන්ම ජල පෝෂක ප්‍රදේශ, පරිසර පද්ධති සහ ස්වභාවික රක්ෂිත ඇතුළු පොදු යහපත උදෙසා වැසි ජලය උපරිම ලෙස උපයෝගී කර ගැනීම සහතික කිරීම සඳහා ගෘහස්ත මෙන්ම ආයතනික මට්ටමින් අදාළ කරගත හැකි වැසි ජලය රැස්කිරීමේ සහ කළමනාකරණය කිරීමේ පියවරයන් විස්තර කිරීම මෙම ප්‍රතිපත්තියේ අරමුණයි. දිවයිනේ ජල සම්පත් විස්තීර්ණ ලෙස කළමනාකරණය කිරීම මඟින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට රජය සතු අභිප්‍රාය සඳහා මෙම ප්‍රතිපත්තිය මනා සහායක් ලබා දෙයි.

02. <u>ප්‍රතිපත්තියේ පදනම සහ ලක්ෂණ</u>

2.1 ප්‍රතිපත්තිය සඳහා පදනම් වූ මූලධර්ම

1. සංරක්ෂණය, තිරසාරභාවය, ජල සුරක්ෂිතතාව (ගුණාත්මකභාවය, ප්‍රමාණය, ප්‍රවේශය සහ පවතින බව), සාම්ප්‍රදායික හා නව දැනුම මෙන්ම ගෝලීය හා දේශීය භාවිතයන් මත වැසි ජලය රැස්කිරීමේ (RWH) මූලිකාංග පදනම් වේ.

2. RWH පාලනය කිරීම තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම, අනුවර්තනය කිරීම, සංශෝධනය කිරීම, පුනරුත්ථාපනය කිරීම, මෙහෙයුම් සහ නඩත්තු කටයුතු, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ජාතික, ප්‍රාදේශීය සහ ප්‍රජා මට්ටමින් අදාළ ආයතනික ව්‍යුහය, නීති, රීති සහ ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක කළ යුතුය.

3. පවත්නා ප්‍රතිපත්ති, සංවර්ධන ඉලක්ක (SDGs, NDCs, ජාතික ඉලක්ක ආදිය), නීති සහ රීති (ඉඩම්, පස, වැව්, කෘෂිකර්ම, වාරිමාර්ග, දේශගුණික විපර්යාස, යටිතල පහසුකම්, නාගරික හා ග්‍රාමීය සංවර්ධනය ආදියට අදාළව) සහ විකාශනය වන තාක්ෂණයන් සමඟ RWH ඒකාබද්ධ කර ඇත.

4. ගෘහස්ථ, ආයතනික, වාණිජ, කාර්මික සහ කෘෂිකාර්මික භාවිතයන් සහ ඉල්ලුම කළමනාකරණය, ගලායන වැසි ජල කළමනාකරණය සහ වැඩිදියුණු කළ ප්‍රවේශය සඳහා භූගත ජලය ප්‍රත්‍යාරෝපණය කිරීම වැනි භාවිතයන් සහ යෙදුම් සඳහා RWH ප්‍රවර්ධනය කෙරේ.

5. RWH මගින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතා සඳහා විසඳුම් සෙවීම, ආන්තික ප්‍රජාවන් සඳහා ජල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය-නාගරික විෂමතා අවම කිරීම හරහා ජල සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම ප්‍රවර්ධනය කරයි.

6. RWH මගින් ජල සුරක්ෂිතතාව සහතික කරන අතරම, ගලායන වැසි ජල කළමනාකරණය, පාංශු ඛාදනය හා භූමි හායනය අවම කිරීම සහ නාගරික තාප දූෂණ (urban thermal pollution) බලපෑම් අඩු කිරීම හරහා දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි.

7. RWH මගින් නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණයන්, යටිතල පහසුකම් මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය ප්‍රශස්තකරණය, ජල සැපයුම් සේවාවලට අදාළ ආර්ථික පාඩු අවම කිරීම මෙන්ම ජාතික, ප්‍රාදේශීය සහ ප්‍රජා මට්ටමින් සැලසුම්කරණය, සැලසුම් සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තුව සඳහා ධාරිතා වර්ධනය කිරීම හරහා ජල සම්පත් කළමනාකරණයේ ආර්ථිකමය ශක්‍යතාව සහ තිරසාරභාවය ඉහළ නංවයි.

8. RWH මගින් බලශක්ති පරිභෝජනය අඩු කිරීම, ජීවනෝපායන් නංවාලීම සහ ස්වභාවික පරිසර පද්ධති ශක්තිමත් කිරීම හරහා නිර්මිත සහ ස්වභාවික පරිසරයන් තුළ *One Health* සංකල්පය ප්‍රවර්ධනය කරයි.

2.2 ප්‍රතිපත්ති ප්‍රකාශය

ජල සුරක්ෂිතතාව, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව (climate resilience) සහ පාරිසරික තිරසාරභාවය ඉහළ නංවන, ජල සම්පත් කළමනාකරණය සඳහා වන තිරසාර සහ ඒකාබද්ධ ප්‍රවේශයක් ලෙස වැසි ජලය රැස්කිරීම (RWH) හඳුනාගෙන ඇත. එය සංරක්ෂණය, සාධාරණත්වය මෙන්ම සාම්ප්‍රදායික හා නූතන දැනුම යන දෙකම භාවිත කිරීමේ මූලධර්ම මත පදනම් වන අතර, පවත්නා ආයතනික, නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ප්‍රවේශය ගෘහස්ත, කෘෂිකාර්මික, වාණිජ සහ භූගත ජලය ප්‍රත්‍යාරෝපණය කිරීම ඇතුළු විවිධ ජල භාවිතයන් සඳහා සහාය දක්වන අතරම, ජාතික සහ ගෝලීය සංවර්ධන ප්‍රමුඛතාවයන්ට අනුකූල වේ. එය විශේෂයෙන් ආන්තික ප්‍රජාවන් සඳහා සාධාරණ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරන අතර වැඩිදියුණු කළ ගලායන වැසි ජල කළමනාකරණය, පාරිසරික හායනය අඩු කිරීම සහ වැඩිදියුණු කළ පරිසර පද්ධති සෞඛ්‍යය හරහා දේශගුණික අනුවර්තනයට දායක වේ. පිරිවැය-ඵලදායී ආයෝජන, නව්‍ය මූල්‍යකරණය සහ මානව යහපැවැත්ම, ජීවනෝපායන් සහ පාරිසරික අඛණ්ඩතාව සම්බන්ධ කරන "One Health" යන දෘෂ්ටිකෝණය කෙරෙහි ද අවධාරණය යොමු කෙරේ. අතිරේක පානීය ජල ප්‍රභවයක් ලෙස වැසි ජලය රැස්කර ගැනීම ප්‍රවර්ධනය කිරීම හරහා වියළි කලාපයේ පානීය ජල අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 30%ක ප්‍රමාණයක් ද, තෙත් කලාපයේ අවම වශයෙන් 15%ක ප්‍රමාණයක් ද සපයා ගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

2.3 ප්‍රතිපත්ති අරමුණු

පාලනය සහ ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම:

ජාතික ප්‍රතිපත්ති, සංවර්ධන ඉලක්ක සහ ආංශික උපායමාර්ග සමඟ අනුකූලතාව තහවුරු කරමින්, වැසි ජලය රැස්කිරීම (RWH) සඳහා වන ඵලදායී ආයතනික, නෛතික සහ නියාමන රාමූන් ස්ථාපනය කිරීම සහ ශක්තිමත් කිරීම.

ජල සුරක්ෂිතතාව ඉහළ නැංවීම:

ගෘහස්ත, කෘෂිකාර්මික, කාර්මික සහ භූගත ජල ප්‍රත්‍යාරෝපණය ඇතුළු බහුවිධ භාවිතයන් සඳහා ජල සම්පත්වල උපයෝජ්‍යතාව, ගුණාත්මකභාවය සහ විශ්වාසනීයත්වය ඉහළ නැංවීමේ තිරසාර විසඳුමක් ලෙසත්, සම්ප්‍රදායික ජල මූලාශ්‍ර සහ ජල සැපයුම් පද්ධති වෙත ප්‍රවේශ වීමේ බාධා පවතින ප්‍රදේශවල විකල්ප ජල මූලාශ්‍රයක් ලෙසත් වැසි ජලය රැස්කිරීම (RWH) ප්‍රවර්ධනය කිරීම.

සාධාරණත්වය සහ සර්වග්‍රාහී ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම:

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතා සඳහා විසඳුම් සෙවීම, ආන්තික සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහාය වීම සහ ග්‍රාමීය-නාගරික විෂමතා අවම කිරීම හරහා වැසි ජලය රැස්කිරීම (RWH) මඟින් ජලය සඳහා ඇති සාධාරණ ප්‍රවේශය තහවුරු කිරීම.

දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික තිරසාරබව ගොඩනැගීම:

ගලායන වැසි ජල කළමනාකරණය සහ ගංවතුර වැළැක්වීමේ කටයුතු සමඟ වැසි ජලය රැස්කිරීම (RWH) ඒකාබද්ධ කිරීම, පාංශු ඛාදනය හා භූමි හායනය අවම කිරීම සහ පරිසර පද්ධතිවල සෞඛ්‍යයට සහාය වීම මඟින් දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම.

ආයෝජන ප්‍රශස්ත කිරීම සහ තිරසාර පද්ධතීන් සඳහා සහාය වීම:

වැසි ජලය රැස්කිරීම (RWH) සඳහා පිරිවැය-ඵලදායී සහ නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණයන් දිරිමත් කිරීම, මෙහෙයුම් පිරිවැය අඩු කිරීම, පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, තිරසාර ජීවනෝපායන් සඳහා දායක වීම සහ සම්ප්‍රදායික ජල සැපයුම් පද්ධති මත පවතින ඉල්ලුම අවම කිරීම.

2.4 ප්‍රතිපත්ති ඉලක්ක

- ජාතික සහ ගෝලීය කැපවීම් ශක්තිමත් කිරීම
- ජල ඉල්ලුම, ජල භාවිතය සහ ආර්ථික කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම
- තිරසාර පරිසර පද්ධති, ප්‍රජාවන් සහ One Health මුල් පිරිම් සහතික කිරීම
- දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ හරිත ප්‍රතිඵල (Green Outcomes) ඉහළ නැංවීම
- ආත්ම ප්‍රතිෂ්ඨාව (Self-Reliance) උදෙසා ජල සුරක්ෂිතතාව විමධ්‍යගත කිරීම

03. <u>ප්‍රතිපත්තියේ විෂය පථය සහ අදාළත්වය</u>

ජාතික, ප්‍රාදේශීය සහ ප්‍රජා මට්ටම්වල භූගත ජලය ප්‍රත්‍යාරෝපණය සහ ගලායන වැසි ජලය කළමනාකරණය ඇතුළුව ගෘහස්ථ, ආයතනික, වාණිජ, කාර්මික සහ කෘෂිකාර්මික අංශ හරහා RWH පද්ධති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම ප්‍රතිපත්ති විෂය පථයට ඇතුළත් වේ. එය පවත්නා නීතිමය සහ ආයතනික රාමු තුළ ක්‍රියාත්මක වන අතර ජාතික සහ ගෝලීය සංවර්ධන ප්‍රමුඛතා සමඟ සමපාත වන අතර, ඉඩම් පරිහරණ සැලසුම්කරණය, යටිතල පහසුකම් සංවර්ධනය සහ දේශගුණික අනුවර්තන උපාය මාර්ග සමඟ RWH ඒකාබද්ධ කරයි. සමස්ත ප්‍රජාවටම සාධාරණ ජල ප්‍රවේශය තහවුරු කරන අතරම, ජල සුරක්ෂිතතාව, පාරිසරික තිරසාරභාවය සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව නැංවීම සඳහා සාම්ප්‍රදායික මෙන්ම නූතන තාක්ෂණයන් යන දෙකම භාවිත කිරීම මෙම පථය මඟින් ප්‍රවර්ධනය කරයි. තවද, ජල කළමනාකරණය පරිසර පද්ධතිවල සෞඛ්‍යය, බලශක්ති කාර්යක්ෂමතාව සහ වැඩිදියුණු කරන ලද ජීවනෝපායන් සමඟ සම්බන්ධ කරන සාකල්‍ය "One Health" ප්‍රවේශයට සහාය දක්වමින්, නව්‍ය මූල්‍යකරණය, පර්යේෂණ හා සංවර්ධන, කාර්යක්ෂම මෙහෙයුම් සහ නඩත්තුව මෙන්ම නිරන්තර අධීක්ෂණය සඳහා වන විධිවිධාන ද මෙයට ඇතුළත් වේ. One Health ප්‍රවේශය මඟින් මානව-සත්ව-ශාක-පරිසර අන්තර්-සබඳතාවයේ පවතින අභියෝගයන්ට විසඳුම් සෙවීමටත්, ඩෙංගු වැනි ජලය ආශ්‍රිත රෝග ඇතුළුව නැඟී එන සහ දේශීයව පැතිර පවතින සතුන්ගෙන් මනුෂ්‍යයන්ට බෝවන රෝග (zoonotic) හේතුවෙන් ඇතිවන මහජන සෞඛ්‍ය අවදානම් අවම කිරීමටත් ප්‍රබල විසඳුමක් සපයනු ලබයි.

වැසි ජලය රැස්කිරීමේ (RWH) ප්‍රතිපත්තිය;

- ගෘහස්ත, ආයතනික, කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ ක්ෂේත්‍රයන් පුරා මුළු දිවයිනටම අදාළ වේ,
- භූගත ජලය ප්‍රත්‍යාරෝපණය, කාර්මික සහ වාණිජමය භාවිතයන් වැනි ඉහළ වටිනාකමකින් යුතු භාවිතයන්, නාගරික ප්‍රදේශවල පොදු ගොඩනැගිලි සහ ස්ථානවල ජනප්‍රිය කිරීම, සහ ගලායන වැසි ජලය කළමනාකරණය ඇතුළු බහුවිධ භාවිතයන් සඳහා යොදා ගැනීම ප්‍රවර්ධනය කෙරේ,
- ජල හිඟතාවයෙන් පෙළෙන, ඉහළ ජල ඉල්ලුමක් පවතින සහ ජලයේ ගුණාත්මකභාවය අඩු ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාව ලබා දේ,
- ගංවතුර, නියඟය සහ පරිසර පද්ධතිවල තිරසාරභාවය සඳහා විසඳුම් සෙවීම උදෙසා දිවයින පුරා පවතින සන්දර්භයන්ට අනුකූල යෙදවුම් සඳහා සහාය දක්වනු ලැබේ,
- නව සංවර්ධන ව්‍යාපෘති සඳහා වැසි ජලය රැස්කිරීම (RWH) ඒකාබද්ධ කිරීම අනිවාර්ය කරන අතර දිරිගැන්වීම්, නියාමන සහ තාක්ෂණික මාර්ගෝපදේශ හරහා පවත්නා ගොඩනැගිලි වල එම පද්ධති නැවත සවිකිරීමට (retrofitting) උනන්දු කෙරේ,
- සැලසුම්කරණය සහ ජල සම්පත් කළමනාකරණය සම්බන්ධ සියලුම අදාළ ආයතන සහ බලධාරීන්ගේ ප්‍රධාන ප්‍රවාහයට (Mainstream) මෙය ඒකාබද්ධ කිරීම,
- ස්ථානීය (in-situ) පස් සහ ජල සංරක්ෂණය මෙන්ම භූගත ජලය ප්‍රත්‍යාරෝපණය / කළමනාකරණය කරන ලද ජලධර ප්‍රත්‍යාරෝපණය (MAR) ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කෙරේ,
- ක්ෂේත්‍රයන් පුරා ජල භාවිත කාර්යක්ෂමතාව, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ සමස්ත තිරසාරභාවය ඉහළ නැංවීම සඳහා සාම්ප්‍රදායික මෙන්ම නව්‍ය ප්‍රවේශයන් යන දෙකම භාවිත කිරීම ප්‍රවර්ධනය කෙරේ,

- වැසි ජලය සීඝ්‍රයෙන් ඉවත් කිරීමේ (බැහැර කිරීමේ) පිළිවෙතෙන් මිදී, ජලය රඳවා තබා ගැනීම සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීම වෙත යොමු වන සුසමාදර්ශී විවර්තනයක් (paradigm shift) ප්‍රවර්ධනය කෙරේ.

04. ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

- පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ සම්බන්ධීකරණය සහිතව, ජල සම්පාදනය පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය මඟින් වැසි ජලය රැස්කිරීමේ ප්‍රතිපත්තියේ අරමුණු පිළිබඳ කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම.
- නව සංවර්ධන ව්‍යාපෘති සඳහා වැසි ජලය රැස්කිරීම අනිවාර්ය කරමින් සහ පවත්නා ගොඩනැගිලි සහ ව්‍යුහයන් සඳහා එම පද්ධති නැවත සවිකිරීම ප්‍රවර්ධනය කරමින්, ප්‍රතිපත්ති, නියාමන සහ ගොඩනැගිලි සංග්‍රහ (building codes) වෙත වැසි ජලය රැස්කිරීම (RWH) ඒකාබද්ධ කිරීම මඟින් පාලනය ශක්තිමත් කිරීම.
- පවත්නා සහ අතහැර දමා ඇති පද්ධති පුනරුත්ථාපනය කරන අතරම, ජල සම්පාදනය, නාගරික සැලසුම්කරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙත වැසි ජලය රැස්කිරීම (RWH) ඒකාබද්ධ කිරීම.
- ඵලදායී ආයතනික සම්බන්ධීකරණයක සහාය ඇතිව, දිරිගැන්වීම්, මූල්‍යකරණ යාන්ත්‍රණයන්, සහ ජල ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම ඇතුළු විධිමත් අධීක්ෂණ හා ඇගයීම් පද්ධති සංවර්ධනය කිරීම.
- ලබාගත හැකි පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් සහ පුහුණු ද්‍රව්‍ය යොදාගනිමින් යාවත්කාලීන කිරීම, සහතික ලත් දිස්ත්‍රික් පුහුණුකරු සංචිත පිහිටුවීම, මෙන්ම අධ්‍යාපනික හා වෘත්තීය පාඨමාලා මාලාවන් වෙත ඒකාබද්ධ කිරීම හරහා අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ සහ සහතිකකරණය මඟින් තාක්ෂණික ධාරිතාව ගොඩනැගීම.
- ජලපෝෂකය (catchment), ගෙනයාම (conveyance), පෙරහන (filtration), පිරිපහදුව (treatment) සහ ගබඩා කිරීමේ (storage) උපාංග ඇතුළත්ව, වැසි ජලය රැස්කිරීමේ (RWH) පද්ධති නිසි ලෙස සැලසුම් කිරීම, සවිකිරීම සහ නඩත්තු කිරීම තහවුරු කිරීම.
- තාක්ෂණික සහාය පද්ධති, තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ මාර්ගෝපදේශ, අත්පොත් සහ යහපරිචයන් බෙදා හැරීම. වැසි ජලය රැස්කිරීමේ ව්‍යුහ සැලසුම්, යෝග්‍යතාවය සහ SOP පිළිබඳ විස්තර සහිත ජාතික වැසි ජලය රැස්කිරීමේ නිර්මාණ අත්පොතක් ප්‍රකාශයට පත් කිරීම. පද්ධති භාවිතය පුළුල් කිරීමට සහ ජල භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පෞද්ගලික අංශය, සංවර්ධකයින්, කර්මාන්ත ශාලා සහ වැසි ජලය රැස්කිරීමේ පද්ධති උපාංග නිෂ්පාදකයින් සමඟ හවුල්කාරිත්වයන් ගොඩනැගීම.
- වැසි ජල රැස්කිරීමේ පද්ධති සැලසුම් කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් අදාළ NVQ සහතික ලබා දෙමින් ප්‍රදේශයේ මේසන්වරුන්, වඩු කාර්මිකයන්, කාර්මික ශිල්පීන් සහ ග්‍රාමීය යෞවනයන්ගේ ධාරිතාව වර්ධනය කිරීම සහ ස්ථාපනය කරන ලද දිස්ත්‍රික් සම්පත් සංචිත පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම.
- විවිධ පරිශීලක කණ්ඩායම් සඳහා භාවිතයට පහසු වැසි ජලය රැස්කිරීමේ (RWH) තාක්ෂණයන් සහ පද්ධතීන්හි නවෝත්පාදනය, ප්‍රමිතිකරණය සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

- විවිධ වැසි ජල රැස්කිරීමේ පියවරයන්හි ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ වඩාත් හොඳින් තීරණය කිරීමට සහ ප්‍රචාරය කිරීමට පර්යේෂණ සහ සමීක්ෂණ සඳහා සහාය වීම.
- නිර්දේශනය (advocacy), බාහිර ප්‍රවේශ වැඩසටහන් (outreach programs), සහ ප්‍රාදේශීය ආයතන හා සිවිල් සමාජය සමඟ සම්බන්ධ වීම හරහා මහජන දැනුවත්භාවය සහ ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීම.
- ජල සැපයුම සහ භූගත ජලය ප්‍රත්‍යාරෝපණය කිරීම වැඩි දියුණු කිරීම සඳහා සාම්ප්‍රදායික පද්ධති (උදා: වැව, කුලම්, පතහ, දියඇලි, කණින ලද ළිං) සහ නවීන ශිල්පීය ක්‍රම (උදා: වැසි ජලය රැස් කරන වළවල්, ජෛව ජල වහන මාර්ග (bioswales), පහත් ජල වහන මාර්ග (swales), සමෝච්ඡ කාණු, සිදුරු සහිත කාණු) ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ ජල ජලාපවහන ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම.
- ජලය එකතැන පල්වීම වැළැක්වීම සහ රෝග වාහකයින්ට ඇතුළුවීමට නොහැකි වන සේ නිසි ලෙස ආවරණය කිරීම මඟින් රෝග වාහකයින් පාලනය කිරීම සහ උන් බෝවීම වැළැක්වීම තහවුරු කිරීම.

05. <u>පාර්ශවකරුවන්</u>

ලංකා වැසි ජලය රැස්කරන්නන්ගේ සංසදය (LRWHF), අදාළ රේඛීය අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශයේ ආයතන, වැසි ජලය රැස්කිරීමේ පද්ධති උපාංග නිෂ්පාදකයින්, අධ්‍යයන හා පර්යේෂණ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGOs) සහ රාජ්‍ය නොවන සංවිධාන (NGOs), ජාත්‍යන්තර සංසද, සංවර්ධන පාර්ශවකරුවන්, ප්‍රජා මූල සංවිධාන, කාර්මික හා කෘෂිකාර්මික ආයතන, සහ රාජ්‍ය, පෞද්ගලික හා ආගමික ස්ථාන ඇතුළු සියලුම නිවාස/ආයතන පාර්ශවකරුවන් විය යුතු අතර, වැසි ජලය රැස්කිරීම සමස්ත ජාතියේම පොදු වගකීමක් බවට පත් කළ යුතුය.

06. <u>ව්‍යවස්ථාදායක සහාය</u>

– පවතින සහ ඉදිරි ඉදිකිරීම් දෙකෙහිම, ප්‍රාදේශීය මට්ටමින් ගංවතුර පාලනය කිරීම, පසට ජලය උරාගැනීමට පහසුකම් සැලසීම සහ සනීපාරක්ෂාව ඉහළ නැංවීමේ උපායමාර්ගයක් ලෙස වැසි ජලය රැස්කිරීම ඇතුළත් කිරීම සඳහා ජලාපවහනය පිළිබඳ මහ නගර සභා / නාගරික සංවර්ධන අධිකාරී (UDA) අනුනීති සංශෝධනය කිරීම.

– අනාගතයේදී ඉදිකෙරෙන නව ගොඩනැගිලි සඳහා වැසි ජලය රැස්කිරීමේ පහසුකම් ඇතුළත් කිරීම ගොඩනැගිලි අයදුම්පතේ අවශ්‍යතාවයක් ලෙස ඇතුළත් කිරීමටත්, එම ගොඩනැගිලි සඳහා 'අනුකූලතා සහතිකය' (Certificate of Conformity) නිකුත් කිරීම ඊට සම්බන්ධ කිරීමටත්, එවැනි පහසුකම් සහිත ගොඩනැගිලි සඳහා වාර්ෂික වරිපනම් ගාස්තු සඳහා වට්ටම් ලබාදීමටත් අනුනීති සංශෝධනය කිරීම.

– පසට ජලය උරාගැනීම වැඩිදියුණු කිරීම සඳහා මාර්ග ඉදිකිරීමේදී මෘදු පදම් කිරීම් (soft paving), පහත් ජල වහන මාර්ග / ජෛව ජල වහන මාර්ග (swales/bioswales) සහ සිදුරු සහිත කානු (porous drains) ඉදිකිරීමට ඉඩ සැලසෙන පරිදි, ජලාපවහනය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරී (RDA) අනුනීති සංශෝධනය කිරීම.

- අනෙකුත් සම්ප්‍රදායික ජල මූලාශ්‍රවලට සමාන තත්ත්වයකින් යුතුව ගෘහස්ථ ජල මූලාශ්‍රයක් ලෙස වැසි ජලය රැස්කිරීම ඇතුළත් කිරීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල (NWSDB) අනුනීති සංශෝධනය කිරීම.
- සංශෝධිත මහ නගර සභා සහ නාගරික සංවර්ධන අධිකාරී (UDA) අනුනීති මඟින් අවශ්‍ය කෙරෙන විධිවිධානවලට අමතරව, වැසි ජල කළමනාකරණයට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කිරීම සඳහා බද්ධ නිවාස අයිතිකම් පනත (Apartment Ownership Act) සංශෝධනය කිරීම.
- නාගරික සංවර්ධන අධිකාරියේ 2235/54 (2021) දරන ගැසට් නිවේදනය මඟින් වර්ග මීටර් 1,000 ට වැඩි ගොඩනැගිලි සඳහා (කාර්මික ව්‍යුහයන් හැර) හරිත ගොඩනැගිලි සහතිකකරණය (Green Building Certification) අනිවාර්ය කර ඇති අතර, එහිදී ජල සංරක්ෂණය, හරිත නවෝත්පාදනය සහ වැසි ජලය රැස්කිරීම පිළිබඳව ඇගයීමට ලක්කෙරේ.
- එක්සත් ජාතීන්ගේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ සම්මුති රාමුව (UNFCCC) වෙත ඉදිරිපත් කෙරෙන තෙවන ජාතික වශයෙන් තීරණය කළ දායකත්වය (NDC 3.0) සහ ජල ක්ෂේත්‍රයේ ජාතික අනුකූලතා සැලැස්ම (NAP) ඇතුළු දේශගුණික ප්‍රතිපත්ති මඟින්, දේශගුණික අවදානම්වලට ඔරොත්තු දෙන විසඳුමක් ලෙස වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය කිරීම.